
# ප්‍රබුද්ධ

## අටවන කලාපය

# පුනර්භව සංකල්පය සහ මතවාද

**ආණමඩුවේ සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සනාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ
අනුනායක මාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය**



**සංස්කරණය**

**ඇහැලේපොල මහින්ද හිමි**

මෙහි අන්තර්ගත සියලු ලිපිවල අදහස් ඒ ඒ ලේඛකයන් සතුවන බැවින් සංස්කාරකගේ අදහස් පිළිබිඹු නොවන බව සැලකුව මනාය. ග්‍රන්ථයේ අක්ෂර වින්‍යාස ලකුණු, ඇද පද බෙදීම ආදිය යෙදීම ඒ ඒ ලේඛකයන්ගේ අභිමතය පරිදි සිදුකරන ලදි.

# ප්‍රබුද්ධ

## අටවන කලාපය - පුනර්භව සංකල්පය සහ මතවාද අංකය

ආණමඩුවේ සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සනාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අනුනායක මාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය.

© ඇහැලේපොල මහින්ද හිමි

පළමු මුද්‍රණය - ශ්‍රී බුද්ධ වර්ෂ 2563
ව්‍යවහාර වර්ෂ 2019

ISBN - 978-955-30-6111-9

පරිගණක අකුරුකරණය - ඇහැලේපොල මහින්ද හිමි

කවරය නිර්මාණය - සනත් ප්‍රියදර්ශන

පරිගණක පිටු සැකසුම - ජී. එච්.ජී. මහේෂිකා මධුභාෂිණී
අයන්ත කුමාරසිංහ

මුද්‍රණය - නෙත්වින් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගම,
නො. 832, ගැටඹේ, මහනුවර.
081-2386908

ප්‍රකාශනය - උඩුගම පන්සල,
අස්ගිරි මහාවිහාරය,
මහනුවර.

8. කර්මය සහ පුනර්භවය පිළිබඳ ව පල වී ඇති විවිධ ඉගැන්වීම් සහ මතිමතාන්තර 104
මහාචාර්ය පූජ්‍ය කරගස්වැවේ විමලානන්ද හිමි

9. ධම්මචක්කප්පවත්තන සූත්‍රය ඇසුරෙන් ජාති, භව හා පුනබ්භව යන සංකල්ප පිළිබඳ විමර්ශනයක් 114
සහය කථිකාචාර්ය පූජ්‍ය මානපිටියේ වජිරබුද්ධි හිමි

10. දීඝනිකායගත පායාසිරාජඤ්ඤ සූත්‍රයෙන් තහවුරු වන පුනර්භව සංකල්පය 122
ගෞරව ශාස්ත්‍රවේදී එන්. තුසිත රාජපක්ෂ

## II කොටස

11. පුනර්භව පර්යේෂණ විධි★ 137
එච්. ඇස්. ඇස්. නිශ්ශංක
(නැවත උපන් දැරිය කෘතියේ කතුවරයා)

12. උපාදානය හා ගන්ධබ්බ අවස්ථාව 145
තාවකාලික කථිකාචාර්ය පූජ්‍ය පහලගම ධම්මික හිමි

13. පුනර්භවය හා චුතූපපාත ඤාණය 150
රාජකීය පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී
පූජ්‍ය ආලංකුලමේ පේමසිරි හිමි

14. මරණය පිළිබඳ ව බෞද්ධ දෘෂ්ටිකෝණය 158
ආචාර්ය පූජ්‍ය කැටකුඹුරේ ධම්මාරාම හිමි

15. කායස්ස භෙදා පරම්මරණා 174
(සංඛාරුප්පත්ති සූත්‍රය ආශ්‍රිත විමර්ශනයක්)
සහය කථිකාචාර්ය පූජ්‍ය වැම්පිටියේ ඉන්දවිමල හිමි

16. පටිසන්ධි විඤ්ඤාණය හා පුනර්භවය 187
ශාස්ත්‍රපති පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමි

# උපාදානය හා ගන්ධබ්බ අවස්ථාව

පහලගම ධම්මික හිමි

සත්ත්වයාගේ වර්තමාන භවයෙන් පසු පෙර හා පසු භව පිළිබඳ ඉගැන්වීම් බුදුදහමේ හමුවෙයි. ඊට පටිච්චසමුප්පාදය මැනවින් පිළිතුරු ලබාදෙයි. ලෝකය හා සත්ත්වයා ප්‍රතීත්‍යසමුප්පන්න න්‍යායෙන් බැහැර නොවෙයි. එකී න්‍යාය තුළ ම අන්තර්ගත වෙයි. සත්ත්වයා යනු සසරට ඇලී ජීවත්වන්නාය.[1] සසර යනු ස්කන්ධ, ධාතු හා ආයතනයන්ය.[2] සත්ත්වයාගේ සසර සම්බන්ධ වන්නේ කර්ම ශක්තියටයි. සසරින් මීදීම කර්මයන්ගේ සංස්කරණය නතරවීමයි. අනුපාදානයෙහි යෙදීමයි. එය එතරම් සුකර කටයුත්තක් නොවන බව පෙනෙයි. ඊට හේතුව කාම ලෝකයෙහි ජීවත් වන්නාට කාමයන්ගෙන් තෘප්තවීමක් පිළිබඳ අදහසක්වත් ඇති නොවෙයි. එය ඇති උනොත් ඇතිවන්නේ මානසික වශයෙන් ඉච්ඡාභංගිත අවස්ථාවක දී ය. සාමාන්‍ය දිවියේදී කාමය පරම සුඛය සේ කටයුතු කිරීම කාම භවයෙහි ස්වභාවය වෙයි. ඒ කාමයන්ගේ විපරිණාමයත් සුඛයක් වශයෙන් ආශ්වාද කිරීමයි. භවකාරක හේතුව වන්නේ උපාදානයයි. එය එක ම හේතු නොවෙයි. භවය ඇතිවීම කෙරේ බලපාන ආසන්නතම හේතුව වශයෙන් පෙනෙයි. 'උපාදාන පච්චයා භවො' උපාදානය අල්ලා ගැනීමයි. එකී අල්ලා ගැනීම සිදු වන්නේ උපාදානය විසිනි. අප යමක් අල්ලා ගත්තේ නම් අපට එහි තෘප්තිය අවසන් වූ විට අත්හරී. නමුත් උපාදාන ග්‍රහණයට අපව ලක් වූ විට අපට කෙතෙරම් අතෘප්තකර වුවත් ඉන් මිදීමට අවකාශ නැත ඊට හේතුව උපාදානයෙන් අපව ග්‍රහණය කොට පැවතීමයි. ඉන් මිදිය යුත්තේ මානසික පුහුණු අභ්‍යාසය තුළිනි. එය වැඩීම, ශ්‍රැතය හෝ ඒ දෙක ම විය හැකිය. භව සංස්කරණයේ ආසන්නතම හේතුව උපාදනය වන්නේ ඒ නිසාය. එහෙත් භවය සඳහා උපාදානය ප්‍රබල කාරණයක් වෙයි. භවය නැති කිරීමට උපාදානය

නැති කළ යුතුයි. "උපාදාන නිරොධො භව නිරොධො"[3] උපාදානය නැති කිරීම සියුම් නුවණින් කළ යුත්තකි. ඊට හේතුව පඤ්චස්කන්ධය තුළ උපාදානය සියුම් ලෙස පැතිරී තිබීමයි. ස්කන්ධ පඤ්චකයෙන් උපාදානය වෙන් කොට ගැනීම අපහසු කටයුත්තකි. උදාහරණයක් වශයෙන් වළං කැබැල්ලක් ගතහොත් එය ඝනත්වයට පත්වී ඇත්තේ මැටි නිසා නොව වැලි නිසා නොව වතුර, වර්ණ නිසා ද නොව, වාතය නිසා නොව, උණුසුම නිසා නොව, මේ සියල්ලේ එකතුව නිසාය. ඒ සියල්ල වෙන් වූ කල ඒවා වෙන වෙන ම හඳුන්වන නම් ඇත. නමුත් තිසි ආකාරයට ඝනවස්තුවක් වූ විට ඒ ඒ නම් පසෙක දා වළං කට්ට වශයෙන් හඳුන්වයි. මැටි හෝ වතුර හෝ ගල් හෝ වැලි හෝ වතුර, සුළඟ, වාතය හෝ වෙනත් හැඳින්වීමක් සිදු නොකරයි. එසේ ම භවය ඇති වන්නේ උපාදානය නිසාය. උපාදානය සඳහා ස්කන්ධ පඤ්චකය ආධාර වෙයි. එය ආශ්‍රය වෙයි. උපාදානය තුළින් භවය නිර්මාණය වූ විට ඒ ඒ ස්කන්ධවල නම් නොකියයි. උපාදානය ආධාර වූ අජ්ඣත්තික බාහිර ඉන්ද්‍රියාරම්මණයන්ගේ ද නම් භාවිත නොකරයි. ඒ භවය සුගති භූමියක් නම් දිව්‍ය හෝ මනුස්ස යන ව්‍යවහාරය සිදු කිරයි. අං, කුර, හොට, හොම්බ, නකුට, වල්ගය, ලොම්, පිහාටු, වරල්, අපා, දිපා, චතුපා, බහුපා සහිත නම් තිරිසන් භවයයි කියයි. එසේ නොවී පේත, අසුර, පරදත්තූපජීවී, යක්ෂ, කුම්භාණ්ඩ, පිසාච, ගන්ධබ්බ නම් ඒ ඒ නම් භාවිත කරයි. භවපාදක කාරණා අතර උපාදානය ප්‍රබල සාධකයක් වශයෙන් සඳහන් කිරීමට පුළුවනි. උපාදානය ෂඩින්ද්‍රියන් තුළ ක්‍රියාත්මක වෙයි. එක්කතරා අවස්ථාවක රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරන අවස්ථාවක දී ශක්‍ර දෙවියන් පැමිණ 'කොනු බො භන්තෙ හෙතු බො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති, කො පන භන්තෙ කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්ති' කිසියම් කෙනෙක් මෙලොවදී ම පරිනිර්වාණයට පත්වෙත් ඇතමෙක් එසේ නොවෙත් ඊට හේතු කුමක්ද? යනුවෙන් විසමා සිටියි. එහි දී බුදුරදුන් පැහැදිලි කරන්නේ "ඉෂ්ට වූ කැමති වූ මනවඩන්නා වූ ප්‍රිය වූ කාමයෝ පිළිබඳ ඇලීම පැතීම නිසා විඥ්ඥාණයට ආශ්‍රය වෙයි. එය උපාදාන කොට පවතී. එම

මානසික තත්ත්වය පිරිනිවීම නැතිවීමට හේතු වෙයි. පිරිනිවීමට නම් උපාදාන රහිත විය යුතු බව දක්වයි.[4] බුදුරදුන් කූටාගාර ශාලාවේ වාසය කරද්දී විශාලානුවරවාසී උග්ග ගෘහපතියා මෙබඳු ම ප්‍රශ්නයක් අසයි. එහි දී ද උපාදානය හේතුවෙන් සසර පැවැත් ම හා නැවැත්ම සිදු වන බව පැහැදිලි කරයි.[5] අන්තරාභවය තුළ දී ද උපාදානය ක්‍රියාත්මක වෙයි.

ගන්ධබ්බ යන්න පාලි ව්‍යවහාරයේ දී 'අන්තැනක ඉපදීමට යෝග්‍යව සිටින්නා, ගන්ධර්වයා, තූර්ය වාදකයා, යෙදී ඇත.[6] එසේම සම්භවෙසී යන නාමයෙන් ද හඳුන්වයි. සර්වාස්තිවාදී ගුරු කුලය අන්තරාභවික යනුවෙන් හඳුන්වයි. යෝගාචාර ගුරු කුලය ආලය විඤ්ඤාණය වශයෙන් හඳුන්වන්නේ මෙම අවස්ථාවයි. ආකාශ චාරීන් හැඳින්වීමට ඍග්වේදය මෙම නාමය භාවිත කරයි. සාංඛ්‍ය දර්ශනය තුළ ලිංග ශරීරය වශයෙන් හඳුන්වයි. ථෙරවාදී සම්ප්‍රදායට අනුව ගන්ධබ්බ යන්න කාලය මූලිකව පැහැදිලි වන බව පෙනෙයි. එනම් චුති හා පටිසන්ධි අතර පවත්නා ස්වභාවයකි. එනම් මරණය හා උපත අතර ඇති කිසියම් කාල පරාශයකි. මෙම සංකල්ප පිළිබඳ බෞද්ධ සන්දර්භයේ දී සිදු වූ වාදවිවාදාදිය බොහෝය. එම තත්ත්වය නිරාකරණය සිදු වී නොමැතිතරම්ය.

මවු කුස පිළිසිඳ ගැනීම සඳහා කරුණු තුනක් සිදු විය යුතු බව සූත්‍ර දේශනාවල ඇතුළත් වෙයි. ඉන් සඵලදායි දාරකෝත්පත්තියක් සිදු වෙයි. ඒ සඳහා භෞතික කරුණු දෙකක් හා පාරභෞතික එක් කරුණක් සම්පූර්ණ විය යුතුය. එසේ නොවූ විට ක්‍රියාදාමය අසාර්ථක වෙයි.

එම කරුණු තුන නම්,

01. මව ඍතු වීම.

02. මව හා පියාගේ සංවාසය.

03. ගන්ධබ්බයකුගේ ආගමනය සිදුවීම.[7]

මෙහි භෞතික කරුණු දෙක විද්‍යාත්මක වේ. ප්‍රත්‍යක්ෂ කරුණකි. එය ඉන්ද්‍රිය ගෝචරය. නමුත් තෙවැනි කරුණ අභෞතිකය. එය ඉන්ද්‍රිය ගෝචරත්වයට එහා ගමන් කළ කරුණකි.

එම නිසා නූතන විද්‍යාත්මක තත්ත්වය මත සැකයට තුඩු දෙයි. විද්‍යාත්මක නොවන බව විද්‍යාත්මක පර්යේෂණයේ දී පවසයි. නමුත් ලොව පවත්නා සෑම දෙයක් ම විද්‍යාත්මකව විශ්ලේෂණය හෝ විවරණය කළ නොහැකිය. එබඳු බොහෝ කාරණා ලොව නැත්තේ නොවේ. එබඳු කරුණු සර්වඥතා ඥානයට ගෝචර වෙයි. වච්ඡගොත්තයන් බුදුරඳුන්ගෙන් වරක් විමසා සිටින්නේ ෂඩ් ශාස්තෘන් සත්ත්වයාගේ උපත පිළිබඳ අදහස් ප්‍රකාශ කරන් බවත් ඒ පිළිබඳ බුදුරඳුන්ගේ ඉගැන්වීම කුමක් ද? යනුවෙනි. එහි දී බුදුරඳුන් "උපාදාන සහිත සත්ත්වයන්ගේ උපත පනවමි, උපාදාන රහිත වූවන්ගේ උපත නොපනවමි''[8] එහි දී උපමාවක් සපයන බුදුරඳුන් ගින්දර වනාහි දර සහිත වූයේ නම් දිලෙයි. දර රහිත වූයේ නම් නො දිලෙයි. යනුවෙන් පැහැදිලි කරයි. එහි දී වච්ඡ අසාසිටින්නේ යම් හෙයකින් ගිනි පුපුරක් සුළඟේ පාවෙත් නම් ඊට උපාදාන වන්නේ කුමක් යනුවෙනි. එහි දී බුදුරඳුන් යම් හෙයකින් සුළඟේ පාවෙන ගිනිපුපුරට වාතය උපාදාන වන බවයි. සත්ත්වයාත් මරණින් පසු කයක් ඇසුරු නොකළේ නම් ඊට කුමක් උපාදාන වෙයිදැයි විමසයි. බුදුරඳුන් "යස්මිං බො වච්ඡ සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුප්පන්නො හොති තමහං තණ්හූපාදානං වදාමි. තණ්හාහිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොති''[9] එහි දී තණ්හාව උපාදානව පවතින බව වැඩිවශයෙන් පැහැදිලි කරයි.

මවක් ගබ්ගැනීමෙ දී ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො යන්න නම් මවු ගැබ පිළිසිඳගන්නා වූ විඤ්ඤාණය හෙවත් ශක්තිය වෙයි. එය භවයෙන් භවයට නොවෙනස්ව ගමන් කරන්නා වූ ආත්මවාදී තත්ත්වය නොවේ. එසේ ම සාති භික්ෂුවගේ විඤ්ඤාණවාදය නොවෙයි. කිසියම් සවිඤ්ඤාණික ශක්තියක් මවු කුසට පැමිණීමෙන් නිසි ගැබ් ගැනීමක් තුළින් සවිඤ්ඤාණික සත්ත්වයකුගේ උපතක් සිදු වෙයි. එකී ගන්ධබ්බ ආගමනය සිදු නොවූයේ නම් මව ඍතු උවත් මවු පියන් දෙදෙනා සංවාසයෙහි යෙදුනත් ගන්ධබ්බයකුගේ ආගමනයක් සිදු නොවූයේ නම් සත්ත්වයකුගේ උපතක් සිදු නොවෙයි. "ගන්ධබ්බො න ච පච්චුපට්ඨිතො හොති, නෙවතාව නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති'' යනුවෙන් අවධාරණ වන්නේ ගන්ධබ්බ ආවස්ථාවයි.

එනම් උපත බලාපොරොත්තුවෙන් සිටින සත්ත්වයා ගන්ධබ්බ නම් වෙයි. එම සත්ත්වයා තණ්හාව උපාදාන කොට පවතී.

ගන්ධබ්බ අවස්ථාව හා අන්තරාභවය පිළිබඳ බොහෝ සෙයින් වාදවිවාද පැවතී තිබේ. ථෙරවාදී න්‍යායෙන් මෙම අවස්ථා දෙස බැලීමට කරුණු සූත්‍රාගතව පැවතිය ද මේ සම්බන්ධයෙන් මහායානික කෘතිවල විචාර පූර්වකව බැලීමට බොහෝ කරුණු හමුවෙයි. සත්ත්වයාගේ උපත හා මරණය අතර පවත්නා තත්ත්වයන් විවරණය වෙයි. එයින් මතුවන්නේ සත්ත්වයා නැවත උපත ලබන බවයි. ඉන් පුනර්භවය සාධක සහිතව පැහැදිලි කර ගත හැකිවෙයි.

## ආන්තික සටහන්

1 සත්තො තථා සො රූපාදීසු සත්තො විසත්තොති කත්වා සත්තොති වුච්චති. දීඝනිකාය අට්ඨකථා සම්පාසාදික සුත්තවණ්ණනා

2 ඛන්ධානං පටිපාටි ධාතු ආයතනානි ච, භවොච්ඡින්නො වත්තමානං, සංසාරොති පවුච්චති.

3 මජ්ඣිමනිකාය i, මහාතණ්හාසඞ්කය සුත්ත, 620 පිටුව.

4 සංයුත්තනිකාය, iv, සක්කපඤ්හ සුත්ත, 2014 පිටුව.

5 එම, වෙසාලි සුත්ත, 227 පිටුව.

6 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල අකාරාදිය, ඇම්.ඩී. ගුණසේන පුද්ගලික සමාගම, කොළඹ, 215 පිටුව.

7 මජ්ඣිමනිකාය i, මහාතණ්හාසඞ්කය සුත්ත, 622 පිටුව. තිණ්ණං ඛො පන භික්ඛවෙ සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති, ඉධ මාතා පිතරො සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති.

8 සංයුත්තනිකාය, iv, කුතුහලසාලා 702 සුත්ත, 2014 පිටුව.

9 එම